# වෙසක් පැතුම්

අවුරුදු පනහකට පෙර අපි දෙදහස් පන්සීයේ සම්බුද්ධ ජයන්තිය පැවැත්වීමු. එදා ඇතැම්හු දියසේන කුමරු පැමිණෙන තෙක් බලාපොරොත්තුවෙන් සිටියහ. දියසේන කුමරු කෙසේ වෙතත් එදා මෙදා තුර "වේල්ස් කුමරු" හා වෙනත් කුමාරුවරු මෙරටට පැමිණ ගොස් ඇත. වේල්ස් කුමරු ලෙස බ්‍රිතානියේ හැඳින්වෙන චාල්ස් වින්ඩ්සර් මහතා අප රටට පැමිණියේ නිදහසේ පනස්වසර සැමරීමට යැයි කියැවෙයි. ඔහු පැමිණීමට ටික දිනකට පෙර කොටි දළදා මාළිගාවට පහර දුන්හ. ඒ ඔහුට විරුද්ධව නොවන බව අමුතුවෙන් කිව යුතු නොවෙයි. පසුගිය අවුරුදු පනහේ සිංහල බෞද්ධයන්ගේ ශේෂ පත්‍රය පිළිබඳ අපට සතුටු විය හැකි එකම කරුණ වනුයේ තවමත් සිංහල බෞද්ධයන් ශේෂවීම පමණය.

අවුරුදු පන්සියයක බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයක් ද මෙරට පවතින බවත් සම්බුද්ධ ජයන්තියෙන් අවුරුදු පනහක් ගෙවී ඇත්තේ ඒ අවුරුදු පන්සීය තුළ බවත් අප අමතක නොකළ යුතුය. පෘතුගීසීන් මෙරටට පැමිණි දින සිට සිංහල බෞද්ධයන්ට එරෙහිව ගෙනගිය ව්‍යාපාරය පිටතින් මෙන්ම ඇතුළතින් ද ක්‍රියාත්මක වෙයි. අද එදාටත් වඩා උග්‍ර ලෙස ක්‍රියාත්මක වන්නේ යැයි කීම නිවැරදිය. ඒ ව්‍යාපාරය පිටතින් මෙන්ම ඇතුළතින්ද ක්‍රියාත්මක වෙයි. කැළේ නැසීමට කැළේ ගහක් උපයෝගී කර ගන්නා අන්දමට අද වඩාත්ම භයානක තර්ජනය එල්ලවන්නේ සිංහල බෞද්ධයන් යැයි කියා ගන්නා අය අතරින්මය. මොවුන්ගෙන් ඇතමතු බොහෝ විට සිංහල බෞද්ධ සංස්කෘතිය වැනසීමට ක්‍රියාත්මක වන අතරම කියන කරුණක් වී ඇත්තේ ඔවුන්ගේ දෙමව්පියන් සිංහල බෞද්ධයන් බවය. ඔවුන් එසේ පවසන්නේ ඔවුන් අතින් සිංහල බෞද්ධ සංස්කෘතියට වරදක් නොවන බව ඒත්තු ගැන්වීම සඳහාය.

අවුරුදු පනහකට පෙර මෙරට තාපස නිකායක් වූ බව වැඩිහිටි අයට අමතක විය නොහැකිය. අද ඇත්තේ එක තාපස නිකායක් පමණක් නොවෙයි. පල්ලි නිකාය එවැනි නිකාය අතරින් එකක් පමණය. උපසම්පදාවක්, ගුරු හාමුදුරු නමක් නොමැති පැවිදි යැයි කියන්නෝ අද ජනමාධ්‍ය මඟින් උඩට ගෙන එනු ලැබෙති. ඔවුන් පවසනු ඇත්තේ බුදුහාමුදුරුවන්ටද ගුරු හාමුදුරුකෙනකු නොසිටි බවය. එහෙත් බුදුහාමුදුරුවන් ඕනෑම අයකුට සිතූ සේ පැවිදි වීමට හැකි යැයි කියා නැත. ඒහි භික්‍ෂු භාවයෙන් වුවද පැවිදි විය හැකිව තිබුණේ උන්වහන්සේ අසලදීය. අවුරුදු දෙසිය පනහකට පෙර වැලිවිට සරණංකර හිමියන් සියමෙන් උපසම්පදාව ගෙන ඒමට කටයුතු කෙළේ උන්වහන්සේ ශාසන සම්ප්‍රදාය දැන සිටි බැවින්ය. බුදුහාමුදුරුවන්ට ගුරු හාමුදුරු කෙනකු නොසිටි බැවින් තමන් වහන්සේටද උපසම්පදාවක් ඇරඹීමට හැකි යැයි සරණංකර හාමුදුරුවෝ කල්පනා නොකළහ.

මෙරට අතීතයේ වැඩ වාසයකර ඇත්තේ සිංහල හාමුදුරුවරු මිස හාමුදුරුවරු නොවෙයි. ඒ හාමුදුරුවරුන්ට අවශ්‍ය වූයේ සිංහල බෞද්ධ ශාසනය රැකීමය. උන්වහන්සේ එහිදී යම් යම් දේ නිර්මාණය කළහ. එහෙත් ඒ සියල්ල කෙළේ සිංහල බෞද්ධ ශාසනය රැකීමට මිස තම තමන්ගේ ප්‍රතිරූප ගොඩනගා ගැනීමටවත් වෙනත් අයකුගේ බළල් අතක් වීමටවත් නොවෙයි. උපන්දා සිට කරපු පවු නැත වරක් වැන්දොත් කැලණියේ යන්න බොහෝවිට හාමුදුරු නමකගේ නිර්මාණයක් විය හැකිය. එය කවදා කවුරුන් අතින් නිර්මාණය වුවද එහි කතෝලික පාපෝච්චාරණයක සේයාවක් දැකිය හැකිය. කතෝලිකයන්ට පව් සමා කිරීමේ වරම ඇති බවත් ඒ නිසා ඇතැම් බෞද්ධයන් කතෝලිකයන් වීමට ඉඩකඩ ඇති බවත් දුටු අයකු සිංහල බුදු සසුන රැකීම අරමුණු කරගෙන ඒ කවි පදයෙන් කියැවෙන අදහස නිර්මාණය කළා විය හැකිය. ඒ එසේ නම් කසිකබල් සමාජයීය විද්‍යාඥයකුට ඒ බුද්ධාගම කතෝලික බුද්ධාගමක් යැයි හැඳින්විය හැකිය. එසේ කිරීමට හැක්කේ එවැනි නිර්මාණ සිංහල බුදු සමයේ අරටුව වී ඇතැයි සිතන්නනන්ටය. ඊනියා ප්‍රොතෙස්තන්ත බුද්ධාගමක් ගැන කතා කරන්නෝ එවැන්නෝ වෙති. මෛත්‍රී බුදුහාමුදුරුවන්ගේ ශාසනයේ නිවන් දැකීමක් ගැන මෙරට සම්ප්‍රදායේ ඇත්තේ ගෞතම බුදුහාමුදුරුවන්ගේ සසුනේ නිවන් දැකීමට බැරි අයට මිස සියල්ලන්ට නොවේ. (බොහෝ දෙනකුට මෛත්‍රී බුදුහාමුදුරුවන්ගේ සසුනේවත් නිවන් දැකිය නොහැකිය) ඒ සම්ප්‍රදාය පල්ලියෙන් දැන ගැනීමට නොහැකිය. එසේත් නැත්නම් පොතපතින් දැනගත නොහැකිය. ඒ සම්ප්‍රදාය නොදත් අයකු ඉන් කියැවෙන්නේ ගෞතම බුදුහාමුදුරුවන්ගේ සසුනේ නිවන් දැකීමට නොහැකි බව යැයි සිතීමට ඉඩ ඇත. එසේ සිතා ඊනියා ගෞතම බුද්ධ රාජ්‍යයක (ශාසනයක නොව) නිවන් දැක්කවීමට මහා ප්‍රචාරයක් ගෙන යැමටද ඉඩ ඇත. බුදුහාමුදුරුවන්ට බුදුරජාණන් වහන්සේ යැයි කියන්නේ උන්වහන්සේට රාජ්‍යයක් තිබුණ නිසා නොවන බව දන්නෝ බුදුසසුනේ සම්ප්‍රදාය දන්නෝය. කිංග්ඩම් ඔෆ් ගෝඩ් හෙවත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඇත්තේ කතෝලික

© Prof. Nalin De Silva

ආගමේය. ඒ බලාගෙන ගෞතම බුද්ධ රාජ්‍යය නිර්මාණය කිරීම සහ උපන්දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ යන්න නිර්මාණය කිරීම අතර ඇත්තේ අහසට පොළොව වැනි වෙනසකි. අපට ඇත්තේ සිංහල බෞද්ධ රාජ්‍යයක් යන සංකල්පයය. ඒ දියකර හැරීමක් වෙනත් බුද්ධ රාජ්‍යයන්ගෙන් සිදුවිය හැකිය.

සුපර්ස්ටාර් විගඩම හා එහි පසුබිම ගැන අපි කතා කෙළෙමු. බුද්ධාගම විද්‍යාත්මක කිරීමේ අපරාධය ගැන අප බොහෝ දේ ලියා ඇත. එහෙත් මෙරට බොහෝ ජනමාධ්‍යවලට අවශ්‍ය වී ඇත්තේ එවැනි දේට ප්‍රචාරය ලබාදීමය. කලාව, විශේෂයෙන්ම සිනමාව උපයෝගී කරගෙන සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව දේශපාලනය කිරීම අද මෙරට කලා වල්ලභයන්ගේ ප්‍රතිපත්තියක් බවට පත්වී ඇත. කසි කබල් මාක්ස්වාදී හෝ ලිබරල් මතවල එල්බගෙන ඇති වල්ලභයෝ සංස්කෘතික යටත් විජිතවාදයක් නොදකිති. ඔවුන්ගෙන් ඇතැමකුට අනුව සංස්කෘතික යටත් විජිතවාදය යනු බිල්ලෙක් පමණකි. ඒ අප විසින් තනාගනු ලැබූ දෙයක් යැයි ඔවුහු කියති. එහෙත් මොවුහුම ආර්ථික හා දේශපාලනික අධිරාජ්‍යවාදයක්, යටත් විජිතවාදයක් ගැන එදා කතා කළහ. ඒ යටත් විජිතවාද ද මාක්ස් හා ඔහුගේ ගෝලබාලයන් විසින් නිර්මාණය කරන ලද බිල්ලන් යැයි මේ වල්ලභයන් කියනු හෝ ලියනු මා අසා හෝ දැක නැත. ලෝකයේ සිටි අංක එකේ සංස්කෘතික යටත් විජිතවාදියා වූ මාක්ස්ට සංස්කෘතික යටත් විජිතවාදයක් තිබීමට නොහැකිය. එහෙත් එපමණකින් සංස්කෘතික යටත් විජිතවාදය යනු බිල්ලෙක් නොවෙයි. පසුගිය වසර පහළොවක පමණ කාලය තුළ අප විසින් කෙරී ඇති එක් ප්‍රධාන කාර්යයක් වනුයේ සංස්කෘතිය මාක්ස්ගේ ඊනියා මතු මහළක සිට පදනමට ගෙන ඒමය. එමගින් එරික් ෆ්‍රොම්ගේ බොරු අපෝහක කතා හා ඔහු තරුණ මාක්ස්ගේ සංස්කෘතිය හා ආර්ථිකය අතර පැවතී යැයි කියන ඊනියා අපෝහක සම්බන්ධතා ද පසෙකට ඇද දමනු ලැබෙයි. බටහිර දැනුම යනුද බටහිර සංස්කෘතික යටත් විජිතවාදයෙහි නිර්මිත කොටසක් පමණකි. අද සිංහල බෞද්ධ සංස්කෘතියට පහරදීමට යොදා ගැනෙන්නේ මේ බටහිර දැනුමය. ඊනියා ප්‍රොතෙස්තන්ත බුද්ධාගම මෙන්ම ඊනියා යථාර්ථවාදී නවකතාවද සංස්කෘතික යටත් විජිතවාදයෙහි අංග වෙයි. අද බටහිර විද්‍යාවෙහිවත් විද්‍යාත්මක ප්‍රවාද ලෙස නොසැලකෙන ෆ්‍රොයිඩ්ගේ හෝ ලකාන්ගේ හෝ මතිමතාන්තර පදනම් කරගෙන නිර්මාණය කෙරෙන කෘති ගැන කියනුම කවරේද? කලාව සම්ම ජාතියේ කලාව සඳහා පමණක් නිර්මාණය කෙරී නැත. කලාව නොව සමාජයෙන් ඈත තිබේ යැයි සැලකෙන ගණිතයද නිර්මාණය වන්නේ ආර්ථික සංස්කෘතික හා දේශපාලනික පසුබිමකය. ඇමරිකාවේ කෙරෙන බොහෝ විද්‍යා පර්යේෂණ සඳහා ප්‍රතිපාදන සපයන්නේ එරට හමුදාවය. බටහිර කලාකරුවන්ට නිදහස ඇත්තේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි නිර්මාණය කිරීමටය.

අද බටහිරයෝ දලයිලාමා ද තම සංස්කෘතිය වෙනුවෙන් කඩේ යවති. ඊනියා පර්යේෂණවලට එකඟ නොවන්නේ නම් බුදු දහම වුවද සංශෝධනය කළ යුතු යැයි දලයිලාමා පසුගියදා කියා ඇත. ඔහුට දෙවියන්ගේම පිහිටය. ඇමරිකාවේ මහායාන පොත්වල අලෙවිය වැඩි වීම බුදු දහමෙහි ඊනියා පුනර්ජීවනයක් ලෙස කිසිසේත් සැලකිය නොහැකිය. දලයිලාමා මෙන්ම අකාෂි ද ඉටුකරන්නේ බටහිර අවශ්‍යතාවය. අද ඔහු මෙරටට ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා ගෙන්වීමට කටයුතු කරයි. බටහිර සංස්කෘතික යටත් විජිතවාදය යනු බිල්ලෙක් නොවෙයි. සිංහල බෞද්ධ සංස්කෘතිය උසස්ම සංස්කෘතිය යැයි අපි කිසිදා කියා නැත්තෙමු. එහෙත් බටහිරයෝ තම සංස්කෘතිය, තම දැනුම උසස්ම දැනුම නොව එකම දැනුම ලෙස එකම විද්‍යාත්මක දැනුම ලෙස ඉදිරිපත් කරති. ඔවුන්ට අනෙක් දැනුම් ඊනියා සාම්ප්‍රදායික දැනුම්ය. එහි වාස්තවික අගයක් නැත. වාස්තවිකත්වය, යථාර්ථය ඇත්තේ බටහිර නිර්මාණවලය. අසරණ සිංහල බෞද්ධයන්ට වර්ගෝත්තමවාදීන් යැයි බැටදෙන නිවටයන්ට ඔවුන්ගේ බටහිර ස්වාමිවරුන් නොකියන කරුණක් නම් බටහිරයන් තරම් වර්ගෝත්තමවාදීන් පිරිසක් කිසිම දිනක මේ මිහිතලය මත ජීවත් වී නොමැති බවය. තමාගේ සංස්කෘතියෙහි උත්තම බව ගැන සිතූ මාක්ස්ද වර්ගෝත්තමවාදියෙකි. මාක්ස්වාදී පැංචෝ අඟුටුමිටු වර්ගෝත්තමවාදීහු වෙති. බටහිරයන් මේ බුද්ධිමය අඟුටුමිට්ටන් ලවා සිංහල බෞද්ධයන්ට වර්ගෝත්තමවාදීන් යැයි කියවා ගන්නේ කුලියටය. මේ වෙසක් දිනවල අපි අවුරුදු දවස්වල නිර්මාණය කළ සිංහල බෞද්ධ කලා විචාරයක් වර්ධනය කරමින් සිටින්නෙමු. දැනටමත් ඉන් අපට විශාල ශක්තියක් ලැබී ඇත. කලාකරුවන්ගේ ඊනියා නිදහස යනු කුමක්ද ඒ කා වෙනුවෙන්ද ද ආදිය ගැන පමණක් නොව බටහිර නූතනත්වයෙහි බිහිවූ යුදෙව් ක්‍රිස්තියානි කලාවේ පදනම ගැන මෙන්ම අරමුණ ගැනද අපි දනිමු. ඉඩ ලැබෙන පරිදි ඒ අනාවරණය කිරීම අපේ වෙසක් පැතුම වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva